කුලියාපිටිය ප්‍රාදේශීය සභාව - 2024
----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව විසින් දේශීය ණය සංවර්ධන අරමුදල වෙත ගෙවිය යුතු රු.36,701,243 ක ණය ශේෂය ජංගම හා ජංගම නොවන ලෙස වෙන් කර මූල්‍ය ප්‍රකාශන තුල දක්වා නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ තුල ජංගම හා ජංගම නොවන ලෙස වෙන් කර පෙන්වීමට කටයුතු කරන බව.	ණය ගෙවීමේ කාලය පදනම්ව වගකීම් ඛාණ්ඩ කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය.
(ආ)	වටිනාකම රු. 18,897 ක් වූ නිදහස් කරන ලද තැන්පතු ශේෂයක් සහ රු.335,010 ක් වූ තැන්පත් කරන ලද මුදලක් ගිණුම් ගතකර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ තුල ජ්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	සියලුම ගණුදෙනු මූල්‍ය ප්‍රකාශ තුල නිවැරදිව සටහන් කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තොග අයිතම 34 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණු අතර රු.16,482 ක් වූ තොග අයිතම 04 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේ දී මූල්‍ය ප්‍රකාශ තුලින් ගැලපීම් කිරීමට කටයුතු කරන බව.	තොග වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

1.6.2 නොසැසඳුණු පාලන ගිණුම හෝ වාතර්ා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පුස්තකාල පොත් හා විවිධ ඇප තැන්පත් වටිනාකම රු 24,198,581 ක් වුවත් උපලේඛන අනුව එම වටිනාකම රු 23,150,239 ක් විය. ඒ අනුව රු1,048,342 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.	මූල්‍ය ප්‍රකාශනය හා උපලේඛනවලට අනුව දක්වා ඇති විචලනය වන රු.463,587 වටිනාකම වසර 01ට අඩු විවිධ තැම්පත් ශේෂය වන අතර එම වටිනාකම රු.457,684 ලෙස නිවැරැදි විය යුතු බවත් පුස්තකාල පොත් සම්බන්ධව පුස්තකාල මට්ටමින් නිවැරදි දත්ත ලබාගෙන යාවත්කාලීනව පවත්වාගෙන යාමටත් කටයුතු කරන බව.	අදාළ වෙනස්කම් හඳුනාගෙන ලේඛන නිවැරදි කර ඒ අනුව ගිණුම්ගත කළ යුතුය.

(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු වාහන වටිනාකම මූල්‍ය ප්‍රකාශන අනුව , ස්ථාවර වත්කම් ලේඛන අනුව හා තක්සේරු වාර්තා අනුව වටිනාකම පිළිවෙලින් රු.52,013,450 ක්, රු.97,010,035 ක් හා රු.82,470,000 ක් වූයෙන් ඉහත වටිනාකම් 03 අතර නොසැසඳීමක් නිරීක්ෂණය විය.	ඉදිරියේ දී උප ලේඛන නිවැරැදි කර එවැනි වෙනසක් ඇති නොවීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව.	උපලේඛන පදනම්ව ලෙජරයේ සටහන් කර ඒ අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය.

1.7 අනුකූල නොවීම

1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 අංක 19 දරණ ජාතික විගණන පනත VII වන පරිච්ඡේදයේ 38(2) වගන්තිය	මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන බවටත් එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳ කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කර ඇති බවටත් ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් ඉටුකළ යුතු ලිඛිත සමාලෝචනයේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන වාර්තා කුලියාපිටිය ප්‍රාදේශීය සභාව මගින් මේ වන විටත් විගණන අධිකාරි කාර්යාලය වෙත යැවීමට කටයුතු කර ඇති අතර අනෙකුත් වාර්තා ඉදිරියේදි යැවීමට කටයුතු කරන බව.	විගණන පනතේ දැක්වෙන අවශ්‍යතාවයන් ඉටුකර විගණනයට වාර්තා කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
	මුදල් රෙගුලාසි 571 (2)	වටිනාකම රු.203,398 ක් වූ කල් ඉකුත් වූ තැන්පතු 03ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉතිරි තැන්පතු නිදහස් කිරීමට කටයුතු සිදු කරමින් පවතින බව.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය.
(ඇ)	2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද වත්කම් කළමණාකරනය පිළිබඳ චක්‍රලේඛය හා			

	කොම්ප්ට්‍රෝලර් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශය.			
	02 වන ඡේදය	රජයේ මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේදී ඒවායේ වටිනාකම නිවැරදිව ගණනය කළ යුතු වුවද , සභාවේ වාහන හැර අනෙකුත් වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කර නොතිබුණි.	ඉඩම් හා ගොඩනැගිලි වර්තමාන අගයට තක්සේරු කිරීමට කටයුතු කරන බව.	චක්‍රලේඛ උපදෙස් අනුව වත්කම් අගය කිරීම සිදුකළ යුතුය.
	03 වන හා 04 වන ඡේද	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේදී රු 5000 හෝ ඊට වැඩි වටිනාකම් සහිත මූල්‍ය නොවන වත්කම් හඳුනා ගත යුතු වුවද , සභාව විසින් 5000ට අඩු ඉඩම් හා ගොඩනැගිල් 58 ක්, යන්ත්‍ර 24 ක් හා ලී බඩු උපකරණ 85 ක් පොත්වල පවත්වා ගෙන ගොස් තිබුණි.	ඉහත තක්සේරු වාර්තා අනුව ලේඛන යාවත්කාලීන තිරීමටත්, වටිනාකම රු. 5,000 ට අඩු උපකරණ ඉවත් කිරීමටත් අවශ්‍ය කටයුතු සිදු කරන බව.	චක්‍රලේඛ උපදෙස් අනුව වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය.
(ඇ)	වයඹ පළාත් ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ඒකකය විසින් ප්‍රජා මූල සංවිධාන සඳහා හඳුන්වා දී ඇති මාර්ගෝපදේශය			
	9.2 (v) ඡේදය	ප්‍රජා මූල සංවිධානවල ගිණුම් විගණනය සඳහා සභාව සහභාගී වී නොතිබුණු අතර ප්‍රජා මූල සංවිධාන ලියාපදිංචි කරවීම හා අධීක්ෂණය සභාව සිදු කර නොතිබුණි	ඉදිරි වර්ෂයන් තුල මෙම ගැටුම්කාරි තත්වයන් මග හැර ලියාපදිංචි නොවූ ප්‍රජා මණ්ඩල ලියාපදිංචි කර සක්‍රිය ප්‍රජා මණ්ඩල බිහි කිරීමට කටයුතු කරන බව.	ප්‍රජා මූල සංවිධාන නියාමනයට ක්‍රියා කල යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.50,862,167ක් වූ අතර , ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.53,217,456ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024 වර්ෂය				2023 වර්ෂය			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම්	බිල් කළ ආදායම්	රැස්කළ ආදායම්	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම්	බිල් කළ ආදායම්	රැස්කළ ආදායම්	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000
වරිපනම් හා බදු	3,802	4,459	4,875	403	3,751	4,032	3,234	789
කුලී	10,497	14,527	14,365	142	11,871	10,887	10,885	2
බලපත්‍ර ගාස්තු	1,275	944	944	-	1,163	1,316	1,316	-
වෙනත් ආදායම්	245,076	120,821	78,605	138,529	131,201	265,057	265,057	-
	----------	---------	---------	-----------	----------	-----------	---------	-------
එකතුව	260,650	140,751	98,789	139,074	147,986	281,292	280,492	791
	======	======	======	======	======	======	=====	====

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායමට පසුගිය වර්ෂයේ අවසාන හිඟ ආදායම එකතුකර රැස්කළ ආදායම අඩුකල පසු දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම ලැබෙන අතර ඉදිරිපත් කළ දත්ත අනුව හිඟ අදායම හා මෙම සංඛ්‍යා අතර පරස්පරතාවයක් පවතින බව නිරීක්ෂණය කෙරේ.	සමාලෝචිත වර්ෂයේ වරිපනම් හා බදු බිල් කළ ආදායමට අදාලව අක්කර බදු හා වරිපනම් බිල් කිරීම ලේඛන සහ ගිණුම අනුව සමාන වුවද 2023 වර්ෂයේ හිඟය ගිණුම අනුව 798 ලෙස නිවැරදි විය යුතු අතර ලේඛන අනුව හිඟය 796 වේ. ඒ අනුව ලේඛන තුලනය හා ගිණුමේ හිඟය අතර රු.1,848 ක මුදල පරස්පරව පවතී.	නිවැරදි තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට වූ රුපියල් මිලියන 0.7 ක් වූ හිග ආදායමක් හා රුපියල් මිලියන 141 ක් වූ වර්ෂයේ බිල් කිරීම්වල එකතුවෙන් රුපියල් මිලියන 401 ක් අයකර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රුපියල් මිලියන 139 ක් තවදුරටත් හිග හිටව පැවතුණි.	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට රු.මි.139 ක් වූ මුළු හිගයෙන් මේ වනවිට රු.මි.57.9 ක් අයකිරීම් සිදු කර ඇති බව.	හිඟ ආදායම් හා බිල්කළ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	**වරිපනම් හා බදු**		
(i)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.159,232 ක වරිපනම් බදු ශේෂය තුල වසර 1 ත් 5 ත් අතර කාලයට අදාලව රු.143,464 ක් සහ වසර 05 ට	රතු නිවේදන නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු කර ඇති අතර එසේ හිඟ නොගෙවන පුද්ගලයන් සඳහා දේපල තහනම් කිරීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.

	වැඩි රු.15,768 ක් අය නොවී පැවතුණි. එම හිඟ ශේෂ අයකර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.		
(ii)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට පැවති රු.243,967 ක හිඟ අක්කර බදු ශේෂය තුල වසර 1 ත් 5 ත් අතර රු.61,675 ක් හා වසර 05 ට වඩා පැරණි රු.182,292 ක් අය නොවී පැවතුණි.	හිඟ මුදල් අයකර ගැනීමටත් අනවශ්‍ය ලෙස බිල් වූ හිඟ මුදල් කපා හැරීමටත් කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.
(ඈ)	**කුලී**		
	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී රු.143,407 ක් අයවිය යුතුව පැවතුණි.	2025 මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදි නිවැරදි කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.
(ඉ)	**වෙනත් ආදායම්**		
	පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.8,184,882 ක් හා මුද්දර ගාස්තු රු.130,270,369 ක් අයකරගෙන නොතිබුණි.	ඉතිරි මුදල් අය කිරීම සඳහා නැවත ඉල්ලීම් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබුණු නමුත් 2024 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා සකස් කර සම්මත කර ගෙන නොතිබුණි. එක් සම්මත අතුරු ව්‍යවස්ථාක් වැළඳගෙන තිබුණු අතර ඒ අතුරු ව්‍යවස්ථාවද ක්‍රියාත්මක මට්ටමේ නොපැවතුණි.	පළාත් සභාව මගින් පනවා ඇති සම්මත අතුරු ව්‍යවස්ථා සියල්ලම පාහේ අප සභාව විසින් වැළඳ ගෙන ඇති අතර දෛනික රාජකාරි ඉටු කිරීමේදි අවශ්‍ය වන්නා වූ නෛතික ප්‍රතිපාදන මෙම අතුරු ව්‍යවස්ථා අනුව සලසා ගන්නා බව.	අතුරු ව්‍යවස්ථා පනවා සභාවේ කටයුතු විධිමත් කළ යුතුය.

(ආ)	වර්ෂය තුළ දිරන කසල ටොන් 845 ක් රැස්කර තිබුණු අතර එය යොදා ගෙන දියර පොහොර ලීටර් 1450 ක් නිපදවා අලෙවියෙන් රු.29,005ක ආදායමක් උපයා තිබුණි. නොදිරන කසල කිලෝග්රෑම් 10,959 ක් අලෙවියෙන් රු.270,935 ක ආදායමක් උපයා තිබුණි.	පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනය මඟින් පොසිල ඉන්ධන දහනය අවම කිරීමට දායකවීම හා පොලිතීන්, ප්ලාස්ටික් අපද්‍රව්‍ය අවිධිමත්ව පිළිස්සීම හැකිතාක් අවම කිරීම යන ක්‍රියා මඟින් ගෝලීය උණුසුම අවම කිරීමට ආංශික දායකත්වයක් ලබා දීම පුළුල් අරමුණ වන අතර එමඟින් මූල්‍ය වටිනාකම් ඉක්ම වූ ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිවනු ඇති බව.	කසළ කළමනාකරණය විධිමත් කර ජනතාවට සුවදායී පරිසරයක් නිර්මාණය කිරීමට ක්‍රියා කල යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් 09 ක ශේෂය රු.149,861,689 ක් වූ අතර එම ශේෂය තුල වසර 1 ත් 5 ත් අතර කාලයට අදාල රු.149,660,815 ක් හා වසර 05 කට වඩා පැරණි රු.198,090 ක් පැවතුණි .එම මුදල් කඩිනමින් අයකර ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.	මුදල් අය කිරීම සඳහා නැවත ඉල්ලීම් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 10 ක එකතු වටිනාකම රු.42,928,583ක් වූ අතර ඒ තුල වසර 1ත් 5ත් අතර කාලයට අදාලව රු.42,808,927 ක් හා වසර 05 කට වඩා වැඩි රු.119,005 ක් පැවතුණි. ඒවායේ පැවැත්ම කෙරෙහි අවදානය යොමුකර නිරවුල් කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී ගෙවීමට කටයුතු කරන බව.	ගෙවිය යුතු ශේෂවල පැවැත්ම ගැන සොයා බලා පියවා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ඉඩම් ලේඛනය අනුව සභාව සතු මුළු ඉඩම් ඒකක 263 න් ඔප්පු ඇති පිඹුරු නොමැති ඉඩම් ඒකක 91 ක් පවතින බව හා සභාව සතු ඉඩම්වල මායිම් හඳුනාගෙන ආරක්ෂාව තහවුරු කර ගැනීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.	2024 සිදු කළ ඉඩම් සමීක්ෂණය මත මුළු ඉඩම් ප්‍රමාණයේ පිඹුරු නොමැති ඉඩම් 91 ක් පවතින බව හඳුනා ගෙන ඇත. සභාවේ පවතින මූල්‍ය ප්‍රතිපාදන මත පිඹුරු සකස් කිරීමේ කාර්යය සිදු කරන බව.	ඉඩම්වල මායිම් හඳුනාගෙන ආරක්ෂාව තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	ලී බඩු, කාර්යාල උපකරණ, යන්ත්‍ර සූත්‍ර, පරිගණක හා පරිගණක මෘදුකාංග සඳහා ලේඛන පවත්වා නොතිබුණි.	මේ වන විට ඒ සඳහා වෙන වෙනම ඉන්වෙන්ට්‍රි ලේඛන සකස් කරමින් පවතින බව.	ස්ථාවර වත්කම් වෙනුවෙන් වෙන වෙනම ලේඛන නඩත්තු කර යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය.

(ඉ)	සභාව සතු එක් බැංකු ජංගම ගිණුමක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 64,014,036 ක ශේෂයක් පැවති අතර එම මුදල් ඵලදායීව ආයෝජනය කිරීමට හෝ සභාවේ අරමුණු සඳහා යොදවා ගැනීමට කටයුතු කර නොතිබුණි.	2025 මැයි 02 දින රු. මිලියන 10 ක් හා 2025 මැයි 20 දින රු. මිලියන 20 ක් ස්ථාවර තැන්පත් වල ආයෝජනය කිරීමට කටයුතු කර ඇත.	අතිරික්ත මුදල් ඵලදායීව ආයෝජනය කිරීමට හෝ සභාවේ අරමුණු සඳහා යෙදවීමට කටයුතු කළ යුතුය.

3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වටිනාකම රු.2,500,000 ක් වූ පල්ලෙවෙල පුස්තකාල ගොඩනැගිල්ල හා මාරපිටියවත්ත උත්සව ශාලාව වසර 15 කට අධික කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි.	ප්‍රමාණවත් පුස්තකාල සංඛ්‍යාවක් සභාවට ඇති නිසා පල්ලෙවෙල ඉදිකර ඇති ගොඩනැගිල්ල රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයකට ලබා දීමට කටයුතු කරන බවත් මාරපිටියවත්තේ අඩක් ඉදිකර ඇති ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම නිෂ්කාර්යක් බැවින් පළාත් පාලන දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති බව.	නිෂ්ක්‍රීයව ඇති වත්කම් ඵලදායී කාර්යයක් සඳහා යොදවා ගැනීමට ක්‍රියා කළ යුතුය.
(ආ)	සභා රථ ගාලෙහි ගාල් කර තිබුණු සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සතු ජීප් රථය සභාවට ලද දිනය හෝ ලද ආකාරය පිළිබඳව ලිඛිත තොරතුරු සභාව සතුව නොතිබුණු අතර , සභාව විසින් මෙම රථයට අදාළව පවත්වා තිබුණු ලොග් සටහන් පොතට අනුව 2013 වර්ෂයේ සිට රථය භාවිත කර ඇති බව අනාවරණය විය. මේ වන විට ජීප් රථය ඉතා අබලන් තත්ත්වයේ පවතින අතර අළුත්වැඩියා කර හෝ භාවිත කිරීමට නොහැකි බැවින් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	ජීප් රථයෙහි මෝටර් වාහන ලියාපදිංචි සහතිකය හමු වූ අතර එය සත්ත්ව නිශ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, කුරුණෑගල. ලෙස සඳහන්ව ඇත. එහෙයින් ඒ පිළිබඳව අදාල ආයතන වෙත ගොස් ඒ පිළිබඳ විමසා ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව.	වත්කම පවරාගෙන සුදුසු කටයුත්තක් කිරීම කඩිනම් කල යුතුය.

3.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කිතලව සතිපොළ සහ කිතලව පුස්තකාලය පිහිටි ඉඩම් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් සභාව වෙත පවරා ගෙන නොතිබුණි.	කිතලව පුස්තකාලය පිහිටි ඉඩම පවරා ගැනීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව.	ඉඩම් පවරා ගැනීම් කටයුතු කඩිනමින් කළ යුතුය.
(ආ)	සභාවේ භෞතිකව පවතින සියලුම වත්කම් පිළිබඳව සමීක්ෂණයක් සිදුකර ඒවා ලේඛනවලට ඇතුළත් කර යාවත්කාලීන කිරීමට කටයුතු කළයුතු	2024 සිදු කළ සමීක්ෂණය මත ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කරමින් පවතින බව.	පරීක්ෂා කර අදාළ වෙනස්කම් හඳුනාගෙන ලේඛන නිවැරදි කර ඒ

වුවත් එසේ නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.439,055,797 ක් වූ ස්ථාවර වත්කම් සඳහා උපලේඛන හෝ ස්ථාවර වත්කම් ලේඛන ඉදිරිපත් කිරීමට නොහැකි වී තිබුණි.		අනුව ගිණුම්ගත කළ යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ ද්විතියික මට්ටමට අදාල තනතුරු 14 ක සහ ප්‍රාථමික මට්ටමට අදාල තනතුරු 02 ක පුරප්පාඩු පැවතුණි. ද්විතියික මට්ටමට අදාල තනතුරු 53 ක සහ ප්‍රාථමික මට්ටමට අදාල තනතුරු 27 ක අතිරික්ත පැවතුණි. තවද අනුමත කාර්යමණ්ඩල ඉක්මවා අනියම් පදනම මත එක් සේවකයෙකුද බඳවා ගෙන තිබුණි.	වැඩ පරිපාලක නිලධාරි සහ සංවර්ධන නිලධාරින් 52 හේතුවෙන් ද්විතියික මට්ටමේ අතිරික්ත සංඛ්‍යාව 53 බවට පත්ව ඇති අතර මේ වන විට සංවර්ධන නිලධාරීන් 07 ස්ථාන මාරු ලබා ඇති බැවින් අතිරික්ත සංඛ්‍යාව 46 බවට පත්ව ඇති බව.	පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් කටයුතු කිරීම සහ අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීමට ක්‍රියා කළ යුතුය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වටිනාකම රු.11,205,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කර්මාන්ත 05ක් හා වැඩසටහන් 24 ක් ඉටු කර නොතිබුණු අතර වාර්ෂික අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් නොකළ රු.456,665 ක ව්‍යාපෘති 02ක් ඉටු කර තිබුණි.	2024 අයවැයෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කළද විවිධ හේතූන් නිසා එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකිවණු බව.	සැලසුම් කල ආකාරයට කර්මාන්ත ඉටු කරමින් මුදල් සඵලදායීව භාවිතා කිරීමට ක්‍රියා කල යුතුය.
(ආ)	වටිනාකම රු.4,025,000 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වෙන් කරමින් සැලසුම් කර තිබුණු වැඩසටහන් 24 ක ප්‍රගතිය සියයට 50 ට අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණි.	අයවැය මඟින් වෙන් කරන ලද ප්‍රතිපාදන යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති නමුත් එහි ප්‍රගතිය සියයට 50 ට වඩා අඩු අවස්ථා පවතී. ඉදිරියේදී වැඩසටහන් නියමිත වර්ෂය අවසන් වීමට පෙර නිසි අයුරින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලබන බව.	ප්‍රතිපාදන වෙන්කළ වැඩසටහන් ක්‍රියාත්මක කර ජනතාවට යහපත් සේවාවක් සැපයිය යුතුය.

4.2 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
නිසි පුරෝකථනයකින් තොරව අයවැය ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 04 ක අයවැයගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර සියයට 17 සිට සියයට 83 දක්වා වූ පරාසයක විචලතාවයක්ද වියදම් විෂයයන් 08ක සියයට 11 සිට සියයට 52 ක දක්වා වූ පරාසයක විචලතාවයක්ද නිරීක්ෂණය විය.	පෙන්වා ඇති අඩුපාඩු සැලකිල්ලට ගනිමින් නිසි කළමණාකාරිත්වයකින් හා නිසි පුරෝකථනයකින් යුතුව අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා විෂය නිලධාරින් දැනුවත් කරන ලද බව.	නිසි පරිදි පුරෝකථනය කර ඇස්තමේන්තු සකස් කළ යුතුය.

4.3 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසාරසංවර්ධන අරමුණු සහ ඉලක්ක ළගා කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.14,330,000 ක ප්‍රතිපාදන වෙන්කර සැලසුම් කර තිබුණු සංවර්ධන වැඩසටහන් 34 ක් වර්ෂය තුළ කිසිදු මූල්‍ය ප්‍රගතියක් අත්පත් කර ගෙන නොතිබුණි.	2024 අයවැයෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කළද සෘජු ප්‍රතිපාදන ලබා නොදීම, සුභ සාධක වියදම් අවම කිරීම, සමහර වැඩසටහන් පරිත්‍යාග හා ආධාර මඟින් ඉටු කිරීම, ආණ්ඩුකාරතුමාගෙන් වැඩසටහන් සඳහා අනුමැතිය නොලැබීම යන හේතුන් නිසා එම අරමුණු හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.	තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීමට ක්‍රියා කළ යුතුය.